ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී ජාතික සංගමය
இலங்கை கிராம உத்தியோகத்தர் தேசிய சங்கம்
SRI LANKA GRAMA NILADHARI NATIONAL ASSOCIATION
SLGNA
ප්‍රධාන කාර්යාලය :-
අංක 94, හන්තාන පාර, මහනුවර.
Head Office :-
No. 94, Hanthana Road, Kandy.
ලි. ප. අංකය / Reg. No. :- TU 10055
slgnassociation1@gmail.com

මගේ අංකය / MY NO: SLGNA/MIN/STR/2026-1 | ඔබේ අංකය / YOUR NO: | දිනය / DATE: 2026.08.04

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

<u>වෘත්තීය ක්‍රියා මාර්ග කැඳවීම.</u>

ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ නො විසඳුණු ගැටළු සඳහා විසඳුම් ලබා ගැනීමට වසර ගණනාවක සිට දේශපාලන අධිකාරියෙන් හා පරිපාලන බලධාරීන් වෙතින් කොතෙක් ඉල්ලීම් කළ ද, එම ගැටළු විසඳීම වෙනුවට සාකච්ඡා සම්මන්ත්‍රණ පමණක් පවත්වමින් කල් මැරීම පමණක් සිදු කිරීම විනා, එම ගැටළු සඳහා මෙතෙක් කිසිදු සාධාරණ විසඳුමක් ලබා දීමට අප අමාත්‍යාංශය හා දේශපාලන අධිකාරිය මෙතෙක් අපොහොසත් වී ඇත.

02. ග්‍රාම නිලධාරී සංගම් ඒකාබද්ධ ව සකස් කළ සේවා ව්‍යවස්ථා කෙටුම්පත නො සලකා හරිමින් පරිපාලන බලධාරීන්ගේ සිතැඟි පරිදි "ඊනියා සේවා ව්‍යවස්ථාවක්" මේ වන විට බලාත්මක කර ඇති අතර ඒ සඳහා ලබා දුන් සංශෝධන වලදී එකඟ වූ එකඟතාවයන් පවා ඇතුළත් කර නොමැති අතර, මෙම එකඟතාවයන් කඩ කිරීම පිළිබඳ අංක SLGNA/MIN/SC/2026-1 දරණ 2026.05.13 දිනැති ලිපිය මඟින් ඔබ වෙත දැනුවත් කර ඇත. සිදු කරන ලද සංශෝධන මඟින් ග්‍රාම නිලධාරී සේවය තුල තව තවත් අර්බුද නිර්මාණය වුවද, එම ගැටළු විසඳීම සඳහා අමාත්‍යාංශය විසින් මෙතෙක් කිසිදු ක්‍රියා මාර්ගයක් හෝ උත්සාහයක් හෝ ගෙන නැත.

03. එමෙන්ම ග්‍රාම නිලධාරීන්ගේ දීමනා ගැටළු විසඳීම සඳහා පත්කල, "ගම්මන්පිල කමිටුව" විසින් අනුමත කරන ලද දීමනා, වර්තමාන ආර්ථික තත්වය හමුවේ නොගැළපුණ ද, එම දීමනා හා නිර්දේශිත යෝජනා, ක්‍රියාත්මක කිරීම සිදු නො කර, ඒ සඳහා විවිධ හේතු දක්වමින්, එම ගැටළු විවිධ ආයතන සහ පුද්ගලයින් වෙත යොමු කර ඇති අතර වර්තමාන ආර්ථික තත්ත්වය හමුවේ පීඩාවට පත්ව සිටින අප නිලධාරීන්ට ඉන් කිසිදු සහනයක් ලැබී නැත. මේ පිළිබඳ අමාත්‍යාංශය භාර ඇමති තුමන් වෙත ඔබට ද පිටපත් සහිත ව යොමු කරන ලද අංක SLGNA/MINITER/FU/26-1 දරණ 2026.06.01 දිනැති ලිපිය මඟින් හා ඔබ වෙත යොමු කරන ලද, SLGNA/MIN/ENERGY/GN/2026-1 අංකය දරණ 2026.03.21 දිනැති ලිපිය මඟින් ද පූර්ව දැනුවත් කිරීම් සිදු කර ඇත.

04. එසේ තිබිය දී, රජය සහ ඔබ ඇතුළු පරිපාලන බලධාරීන් විසින් ග්‍රාම නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරි වලට අමතරව විවිධ වැඩ සටහන් හා විෂය ගත නිලධාරීන්ගේ වගකීම්, ග්‍රාම නිලධාරී වෙත පවරමින් තිබීම පිළිබඳ අප සංගමය විසින් අවස්ථා ගණනාවක දීම පෙන්වා දී ඇති නමුත්, ඒ සඳහා මෙතෙක් යහපත් ප්‍රතිචාරයක් දැක්වීමට ඔබ ඇතුළු පරිපාලන බලධාරීන් අපොහොසත් වීම අතිශය කණගාටුවට හේතුවකි.

05. එබැවින්,

- ග්‍රාම නිලධාරී සේවය සඳහා ගැළපෙන, අර්බුද වලින් තොර සේවා ව්‍යවස්ථාවක් ලබා ගැනීම.
- ග්‍රාම නිලධාරී සේවය සඳහා ඉන්ධන, කාර්යාල, ලිපි ද්‍රව්‍ය, දින වැටුප් ( days pay) දීමනා පිළිබඳ ගම්මන්පිල කමිටුවේ නිර්දේශ ( 2026.07.22 දින නියෝජ්‍ය මුදල් ඇමති තුමා වෙත ඉදිරිපත් කල අංක SLGNA/Allowances/PUB&FPE/2026-1 දරණ 2026.07.21 දිනැති ලිපියට අනුව ) ක්‍රියාත්මක කිරීම.
- බඳවා ගැනීමේ අවස්ථාවේ සිට අතිමහත් අසාධාරණයකට පත්ව සිටින "2009/10 කණ්ඩායමේ" ගැටළුව සඳහා විසඳුමක් ලබා ගැනීම.

යන කරුණු මුල් කර ගනිමින් 2026.08.05 දින සිට පහත සඳහන් වෘත්තීය ක්‍රියා මාර්ගයෙහි නිරත වන බව කාරුණිකව දැනුම් දෙමි.

06. ඒ අනුව,

1. පොදු කොට්ඨාශ දින රැස්වීමට හැර අනෙකුත් සියලු ම රැස්වීම් වලට සහභාගි නොවීම. (විශේෂයෙන් දේශපාලන අධිකාරිය සම්බන්ධ වන වැඩ සටහන් හා උත්සව වලට සහභාගී නොවීම.)
2. 2026.08.10 හා 2026.08.11 දින ලෙඩ නිවාඩු වාර්තා කරමින් සියලු ම රාජකාරි වලින් ඉවත් වීම.

සිදු කරන බවත්, ඉහත ගැටළු වලට සාධනීය ප්‍රතිචාරයක් ලැබෙන තෙක්, මෙම වෘත්තීය ක්‍රියා මාර්ගය අඛණ්ඩව ක්‍රියාත්මක කරන බවත්, ඒ සඳහා සාධනීය ප්‍රතිචාර නො ලැබෙන්නේ නම්, මෙම වෘත්තීය ක්‍රියා මාර්ගය සියලු ම රාජකාරි වලින් ඉවත් වීම දක්වා තීව්‍ර කිරීමට සිදු වන බවත් මෙයින් දන්වා සිටිමි.

07. මෙම වෘත්තීය ක්‍රියා මාර්ගය ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී ජාතික සංගමයේ සාමාජිකයින්ට මෙන්ම වෘත්තීය සමිති ආඥා පනතේ විධි විධාන ප්‍රකාර, පොදු අරමුණක් වෙනුවෙන් සහය දක්වන සියලු ග්‍රාම නිලධාරීන්ට ද අදාළ වන බවත්, මෙම වෘත්තීය ක්‍රියා මාර්ගය ගනු ලබන්නේ ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් නීත්‍යානුකූල විධි විධානයන්ට අනුකූලව වන බැවින් මේ සඳහා කිසිදු බාධාවක් නො කරන ලෙසට ද අවධාරණය කරමි.

මෙයට,

සංගමයේ අණ පරිදි,

ඩබ්ලිව්. ඒ. පී. ඒ. විජේරත්න
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී ජාතික සංගමය
අංක 94, හන්තාන පාර,
මහනුවර.

ඩබ්ලිව්. ඒ. පී. ඒ. විජේරත්න,
ප්‍රධාන ලේකම්,
ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී ජාතික සංගමය

පිටපත් :-

| | |
|---|---|
| 1. අතිරේක ලේකම් - ස්වදේශ කටයුතු | කා.දැ.පි. |
| 2. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ග්‍රාම නිලධාරී පාලන | කා.දැ.පි. |
| 3. සභාපති - 2009/10 එකමුතුව | සහභාගි වීම සඳහා. |
| 4. ජාතික විධායක සභිකයින් | සාමාජිකයින් සහභාගි කිරීම සඳහා. |
| 5. ගොනුවට. | |

එකමුතුවෙන් පෙරට

ගරු සභාපති
ඒ.එම්. දුෂාන්තක බණ්ඩාර
0767268680 / 0718168680
Hon. Chairman
A.M.Dushanthaka Bandara
0767268680 / 0718168680

ගරු ලේකම්
ඩබ්ලිව්.ඒ.පී.ඒ. විජේරත්න
(නෙවිල් විජේරත්න)
0779209204 / 0789209204(whatsapp)
Hon. Secretary
W.A.P.A. Wijerathna (Neville Wijerathna)
0779209204 / 0789209204(whatsapp)

ගරු භාණ්ඩාගාරික
එච්.කේ. ලක්මන් ඉන්දික
0777457748
Hon. Treasurer
H.K.Lakman Indika
0777457748